# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2017 අංක 10 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2017 ජූලි මස 21 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


2017 ජූලි මස 21 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

## 2017 අංක 10 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 2017 ජූලි මස 21 වන දින]

එල්.ඩී.—ඕ. 56/2015

**1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ ඇතැම් නියමවලින් අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ තැනැත්තන් නිදහස් කිරීම සඳහා විශේෂ විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

පූර්විකාව.

මෑත අතීතයේ දී ත්‍රස්තවාදී සටන්කාමී හෝ වෙනත් කණ්ඩායමක යම් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් වශයෙන් ඇතැම් තැනැත්තන් අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ බැවින් ද:

අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ තැනැත්තන් එසේ අවතැන්වීමට පෙර ඔවුන්ගේ ස්ථිර වාසස්ථාන පිහිටි මැතිවරණ කොට්ඨාසවල දී ස්වකීය ඡන්ද බලය පාවිච්චි කිරීමට එසේ අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ තැනැත්තන්ට සහ ඔවුන්ගේ ඡන්දය දීමට සුදුසුකම්ලත් දරුවන්ට හැකි කරවීම පිණිස රජය විසින් ප්‍රතිපත්තියක් සකස් කර ඇති බැවින් ද:

එම ප්‍රතිපත්තිය බලාත්මක කිරීම සඳහා විශේෂ නෛතික විධිවිධාන සැලැස්වීමට දැන් අවශ්‍ය වී ඇති බැවින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මෙම පනත 2017 අංක 10 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ඇති අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ තැනැත්තන්.

2. (1) 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 වන ව්‍යවස්ථාවට යටත්ව—

(අ) අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ හෝ අවතැන් වී සිටි තැනැත්තකුව සිටියා වූ ද;

(ආ) 2009 වර්ෂය අවසන් වන තෙක් වූ යම් වර්ෂයක් සඳහා යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා වූ ඡන්ද හිමි නාමලේඛනයක නම ඇතුළත් වන්නා වූ ද; සහ

2—PL 005183—2861 (2017/05)

(ඇ) 2009 වර්ෂයෙන් පසුව වලංගුව පැවති කවර හෝ නාමලේඛනයක තමාගේ නම ඇතුළත් කරනු ලැබ නොමැති වූ ද,

ශ්‍රී ලංකාවේ ඕනෑම පුරවැසියකුට ඉහත (අ), (ආ) සහ (ඇ) යන ඡේදවල නිශ්චිතව දක්වෙන කරුණු සනාථ කරනු ලැබීම මත සහ ඔහු අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ හෝ අවතැන් වී සිටි තැනැත්තකු බවට ඔහු දනට පදිංචිව සිටින ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කිරීම මත, 2009 මැයි මස 18 වන දිනයට පෙර තමා ස්ථිරව පදිංචි වී සිටි මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද හිමි නාමලේඛනයෙහි ලියාපදිංචි කරනු ලැබීම සඳහා එම මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත ඉල්ලීමක් කිරීමට හිමිකම ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ඉල්ලීම, මැතිවරණ කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ සහ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන එක් එක් භාෂාවලින් පළවන යටත් පිරිසෙයින් එක් පුවත් පතකවත් පළකරනු ලබන දැන්වීමක් මගින් නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයක දී හෝ එදිනට පෙර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුව ද, ඒ උපවගන්තියේ සඳහන් පුරවැසියකුගේ—

(අ) එම පුරවැසියා අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ තැනැත්තකු බවට පත් වූ දිනයේ දී වයස අවුරුදු දහ අටට එළඹ නොසිටියා වූ ද, ඉල්ලීම කරනු ලබන අවස්ථාවේ දී වලංගුව පැවති ඡන්ද හිමි නාමලේඛනය ප්‍රතිශෝධනය කිරීම ආරම්භ කළ දිනයේ දී වයස අවුරුදු දහඅට හෝ ඊට වැඩි වයසකට එළඹ ඇත්තා වූ ද;

(ආ) එම පුරවැසියා අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ තැනැත්තකු බවට පත්වීමෙන් පසුව ඉපදී, ඉල්ලීම කරනු ලබන අවස්ථාවේ දී වලංගුව පැවති ඡන්ද හිමි නාමලේඛනය ප්‍රතිශෝධනය කිරීම ආරම්භ කළ දිනයේ දී වයස අවුරුදු දහ අට හෝ ඊට වැඩි වයසකට එළඹ ඇත්තා වූ ද; සහ

(ඇ) 2009 වර්ෂයෙන් පසුව වලංගුව පැවති කවර හෝ නාමලේඛනයක තමාගේ නම ඇතුළත් කරනු ලැබ නොමැති වූ ද,

දරුවන්ට, ලියාපදිංචි කිරීමට අපේක්ෂිත දරුවාගේ උප්පැන්න සහතිකය සහ ඔහු පදිංචිව සිටින ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී විසින් ඉහත (අ) හෝ (ආ) සහ (ඇ) කරුණු සනාථ කරමින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කිරීම මත, ඒ උපවගන්තියේ ප්‍රදානය කරනු ලැබූ හිමිකම ව්‍යාප්ත කරනු ලැබිය යුතු ය.

හිමිකම් පෑම් ලැයිස්තුව.

**3.** (1) 2 වන වගන්තියේ සඳහන් තැනැත්තන්ගේ නම් ලැයිස්තුවක් ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් පිළියෙල කරනු ලැබිය යුතු අතර, එම ලැයිස්තුව සම්පූර්ණ කර ඇති බවට සහ දවසේ සියලු යුක්ති සහගත වේලාවන් තුළ දී එම ලැයිස්තුව පරීක්ෂා කිරීම සඳහා ලියාපදිංචි කිරීමේ නිලධරයාගේ කාර්යාලයේ තබා ඇති බවට, සඳහන් කරමින් ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් ගැසට් පත්‍රයේ සහ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන එක් එක් භාෂාවලින් පළවන යටත් පිරිසෙයින් එක් පුවත් පතකවත් දැන්වීමක් පළ කළ යුතු ය.

(2) (අ) යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා වූ යම් ඡන්ද හිමි නාම ලේඛනයක ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කර ඇත්තා වූ ද, (1) වන උපවගන්තියේ සඳහන් ලැයිස්තුවේ තමාගේ නම ඇතුළත් කර නොමැති වූ ද, යම් තැනැත්තකු විසින් ගැසට් පත්‍රයේ පළ වූ දැන්වීමේ දින සිට දින දහහතරක් ඇතුළත ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත ලිඛිතව අභියාචනය කළ හැකි ය.

(ආ) ලියාපදිංචි කිරීමේ නිලධරයාගේ තීරණවලට එරෙහිව වූ විරෝධතා සහ අභියාචන සම්බන්ධයෙන් 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වන වගන්තියේ (7) වන උපවගන්තියේ සිට (16) වන උපවගන්තිය දක්වා වූ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(ඇ) අභියාචනය කිරීමෙන් පසුව සහ පරීක්ෂණයෙන් පසුව 4 වන වගන්තියේ සඳහන් පරිපූරක නාමලේඛනයෙහි එම ඉල්ලුම්කරුගේ නම ඇතුළත් නොකිරීමට ලියාපදිංචි කිරීමේ නිලධරයා තීරණය කළහොත් ලියාපදිංචි කිරීමේ නිලධරයාගේ තීරණයේ දින සිට සති එකක් ඇතුළත අතෘප්තියට පත් අභියාචක විසින් ප්‍රතිශෝධනය කිරීමේ නිලධරයා වෙත අභියාචනය කළ හැකි ය. තව ද, මේ ඡේදය යටතේ කරනු ලබන අභියාචනවලට 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 15 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සිට (5) වන උපවගන්තිය දක්වා වූ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

පරිපූරක නාමලේඛනය.

**4.** පරීක්ෂණයක් සහ තීරණය කිරීමක් අවශ්‍ය වුවහොත් එම තීරණය කිරීම සිදු කිරීමෙන් පසු 3 වන වගන්තිය යටතේ පිළියෙල කරන ලද ලැයිස්තුවෙහි නම් ඇතුළත්ව ඇති තැනැත්තන්ගේ නම් ඇතුළත් වන පරිපූරක නාමලේඛනයක්, එක් එක් මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් පිළියෙල කර සහතික කළ යුතු අතර, 3 වන වගන්තිය ප්‍රකාරව අවසන් කළ යුතු ය:

එසේ වුව ද, ප්‍රතිශෝධනය කිරීමේ නිලධරයා වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයක් අවසන් නොවී පවතින කාලය තුළ දී ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් පරිපූරක නාමලේඛනය සහතික කරනු ලැබිය හැකි අතර, ඉන් පසු එම අභියාචනය පිළිබඳව කරනු ලබන තීරණය මත ප්‍රතිශෝධනය කිරීමේ නිලධරයාගේ තීරණයට අනුකූලව ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් යම් තැනැත්තකුගේ නම එම නාමලේඛනයට ඇතුළත් කිරීම හෝ එම නාමලේඛනයෙන් ඉවත් කිරීම හෝ කරනු ලැබිය යුතු ය.

වැරදි.

**5.** (1) යම් තැනැත්තකුට ඡන්ද හිමි නාමලේඛන දෙකක හෝ ඊට වැඩි ගණනක ඔහුගේ නම ඇතුළත් කරවා ගැනීමට සුදුසුකම් තිබුණ ද, එය නොතකා, පරිපූරක නාමලේඛනයේ නම ඇතුළත්ව ඇති එම තැනැත්තාට වෙනත් යම් ඡන්ද හිමි නාමලේඛනයකට ඔහුගේ නම ඇතුළත් කරවා ගැනීමට හිමිකමක් නොමැත්තේ ය.

(2) යම් ඡන්ද හිමි නාමලේඛනයක එක් වරකට වැඩි වාර ගණනක් නම ඇතුළත් කරවා ගැනීමට යම් තැනැත්තකුට සුදුසුකම් තිබුණ ද, එය නොතකා, එකම ඡන්ද හිමි නාමලේඛනයේ එක් වරකට වැඩි වාර ගණනක් ඔහුගේ නම ඇතුළත් කරවා ගැනීමට කිසිම තැනැත්තකුට හිමිකමක් නොමැත්තේ ය.

(3) මේ පනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, පරිපූරක නාමලේඛනයෙහි තමාගේ නම සඳහන්ව ඇති යම් තැනැත්තකුගේ නම වෙනත් යම් ඡන්ද හිමි නාමලේඛනයක ඇතුළත්ව ඇත්නම් සහ එම තැනැත්තා විසින් මැතිවරණ කොට්ඨාස දෙකක හෝ ඊට වැඩි ගණනක දී තම ඡන්දය පාවිච්චි කරයි නම්, ඔහු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ එම තැනැත්තා යටත් වන්නේ ය.

(4) මේ පනතේ සඳහන් යම් කාර්යයක් සඳහා අසත්‍ය තොරතුරු හෝ ව්‍යාජ ලේඛන ඉදිරිපත් කරනු ලබන 2 වන වගන්තියේ සඳහන් යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ වරදකරු කරනු ලැබීමේ දී අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ එම තැනැත්තා යටත් වන්නේ ය.

පනත ක්‍රියාත්මක වීමේ කාලසීමාව.

**6.** මෙම පනතේ විධිවිධාන මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දින සිට අවුරුදු හතරක කාල සීමාවක් සඳහා බලාත්මකව පවතින්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**7.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**8.** මේ පනතෙහි—

"මැතිවරණ කොමිෂන් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලැබූ මැතිවරණ කොමිෂන් සභාව අදහස් වේ;

"අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ තැනැත්තා" යන්නෙන්, ශ්‍රී ලංකාවේ ස්ථිර වශයෙන් පදිංචි වී සිටියා වූ ද, 2009 මැයි මස 18 වන දිනයට පෙරාතුව කවර හෝ අවස්ථාවක දී ත්‍රස්තවාදී සටන්කාමී හෝ වෙනත් කණ්ඩායමක යම් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස ඔහුගේ ස්ථිර පදිංචි ස්ථානය හැරයාමට සිදු වූ හෝ හේතු වූ ද, දැනට තම මුල් පදිංචි ස්ථානයෙන් පිටත ශ්‍රී ලංකාව තුළ පදිංචි වී සිටින්නා වූ ද, ශ්‍රී ලංකාවේ පුරවැසියකු අදහස් වේ;

"ලියාපදිංචි කිරීමේ නිලධරයා" යන්නට, 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ ඇති අර්ථය ම තිබිය යුතු ය;

"වලංගුව පැවති නාම ලේඛනය" යන්නට, 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ප්‍රතිශෝධනය කිරීමේ නිලධරයා" යන්නට, 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ ඇති අර්ථය ම තිබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.